(c) www.sinhalalyrics.com

කවදා පායන්ද අප දණසුරානෝ
රණබිමකට සරිලන සෙනෙවියානෝ
මුඩු බිමකට සරිලන ජල කඳානෝ
සුන් බුන් කොඳු ඇට සිටුවන රජානෝ

කවදා පායන්ද අප පුන් සඳානෝ
පරහිත පිනිස දළ දත් දෙන ඇතානෝ
නිදුකින් ඉන්න මග පෙන්වන වෙදානෝ
මුසා බසින් අප නොපෙලන රජානෝ

කවදා එත්ද අපගේ එක් නෙතානෝ
ගිමනට හෙවන දෙන තුඟු නුග තුරානෝ
අප සම බිමක රඳවන සොහොයුරානෝ
රජෙකැයි අපට නොසිතෙන මහ රජානෝ

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - සරත් දසනායක

(c) www.sinhalalyrics.com